# 9 තේරීම

මෙම පාඩම අධ්‍යයනය කිරීමෙන් ඔබට,
- සමූහයක් පොදු වූ ලක්ෂණ ඇති කාණ්ඩවලට වෙන් කිරීමට,
- පොදු ලක්ෂණයට අනුව කාණ්ඩ නම් කිරීමට,

හැකියාව ලැබේ.

## 9.1 සමූහයක් පොදු වූ ලක්ෂණ ඇති කාණ්ඩවලට වෙන් කිරීම

එදිනෙදා ජීවිතයේදී අපගේ අවශ්‍යතාවලදී නිවැරදි තීරණ ගැනීම සඳහා විවිධ ද්‍රව්‍ය හා වෙනත් දෑ ඒවාට විශේෂිත වූ පොදු ලක්ෂණ අනුව තෝරා වෙන් කර ගැනීමට අපට සිදු වේ.

**නිදසුන 1**

පහත දී ඇති රූප හොඳින් නිරීක්ෂණය කරමින් ඒවායේ දැකිය හැකි පොදු ලක්ෂණ මොනවාදැයි බලමු.



පොදු වූ ලක්ෂණයකට අනුව ඉහත රූපයේ දක්වා ඇති ද්‍රව්‍ය මෙසේ කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ය.

- රස කැවිලි
- පලතුරු

රස කැවිලි →



පලතුරු →



## නිදසුන 2

පහත දී ඇති රූප හොඳින් නිරීක්ෂණය කරමින් ඒවායේ දැකිය හැකි පොදු ලක්ෂණ මොනවාදැයි බලමු.



පොදු වූ ලක්ෂණයකට අනුව ඉහත රූපයේ දක්වා ඇති සතුන් මෙසේ කාණ්ඩ කළ හැකි ය.

- පක්ෂීන්
- මත්ස්‍යයින්

පක්ෂීන් →



මත්ස්‍යයින් →



## නිදසුන 3

පහත දී ඇති අක්ෂර පොදු වූ ලක්ෂණයක් අනුව කාණ්ඩ තුනකට වෙන් කරමු.




එවිට පහත පරිදි පිළිතුර ලැබේ.

- සිංහල අකුරු - අ, ඉ, ඔ, ට, ක
- සංස්කෘත අකුරු - अ , उ , ड , य
- ඉංග්‍රීසි අකුරු - A, B, C, D, E

ඉහත ආකාරයට කිසියම් සමූහයක් පොදු වූ ගුණාංග පදනම් කර ගනිමින් කාණ්ඩ කිහිපයකට වෙන් කර ගත හැකි ය.



## 9.1 අභ්‍යාසය

1. පහත දැක්වෙන සමූහ පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර ඒ එක් එක් කාණ්ඩය සඳහා සුදුසු නමක් බැගින් ලියන්න.




2. පන්තියක ළමයි අතරින් ක්‍රීඩාවලට සම්බන්ධ වන ළමයි කිහිපදෙනෙකුගේ නම් පහත දැක්වේ. එම ළමයි කාණ්ඩ දෙකකට වෙන් කර එම කාණ්ඩ දෙක සඳහා සුදුසු නම බැගින් ලියන්න.




3. පහත දක්වා ඇති භාණ්ඩ ඒවාට ඇති පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කර කාණ්ඩ දෙක සඳහා සුදුසු නමක් බැගින් ලියන්න.











**4.** පහත දී ඇති ඉංග්‍රීසි අක්ෂර පොදු ලක්ෂණ අනුව කාණ්ඩ දෙකකට වෙන් කරන්න.

*A* *b* *t* *f* *g* *I* *u* *r* *d* *E* *M*

**5.** පහත දී ඇති වස්තු සමූහය ඒවාට පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ 3කට වෙන් කර එම කාණ්ඩ සඳහා සුදුසු නමක් බැගින් යෝජනා කරන්න.

නැව, ත්‍රී රෝද රථය, කරත්තය, බෝට්ටුව, බසය, ගුවන් යානය, දුම්රිය, පා පැදිය, ට්‍රැක්ටරය, රුවල් නැව, හෙලිකොප්ටරය

**6.** පහත දක්වා ඇති සතුන් ඔවුනට පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ 3කට වෙන් කර එම කාණ්ඩ සඳහා සුදුසු නමක් ඉදිරිපත් කරන්න.

බල්ලා, කොටියා, ගිරවා, නයා, බළලා, පිඹුරා, මයිනා, නරියා, කිඹුලා, කපුටා, ගවයා, සිංහයා

**7.** පහත දැක්වෙන සංඛ්‍යා ඒවාට පොදු වූ ලක්ෂණයක් අනුව කාණ්ඩ 2කට වෙන් කරන්න.

$\frac{1}{2}$ $\frac{2}{5}$ $\frac{1}{3}$ $\frac{1}{7}$ $\frac{3}{4}$ $\frac{5}{8}$

**සාරාංශය**

- සමූහයක ඇති දෑ පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩවලට වෙන් කළ හැකි ය.
- පොදු වූ ලක්ෂණ අනුව කාණ්ඩ නම් කළ හැකි ය.